www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා යුද හමුදා නායකයා රාජ්‍යතාන්ත්‍රික ගැටුමක් නිර්මානය කරයි

## Sri Lankan army head provokes diplomatic furore

**නන්ද වික්‍රමසිංහ විසිනි**
**2008 දෙසැම්බර් 20**

ශ්‍රී ලංකාවේ යුද හමුදාවේ නායක ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකා විසින් දෙසැම්බර් මස මුල් සතියේ අවුලුවා ලූ රාජ්‍යතාන්ත්‍රික ගැටුම කොලඹ පාලන තන්ත්‍රය තුල යුද හමුදාව අත් කරගෙන ඇති දේශපාලන බලපෑම සිත් කාවදින ආකාරයෙන් ඉස්මත්තට ගෙනෙයි. 2006 වර්ෂයේ මැද්දෑවේ දී  රට යලිත් යුද්ධයට ඇද දැමූ ජනාධිපති මහින්ද රාජපක්ෂ එහි ප්‍රතිඵලයක් ලෙස ආන්ඩුව තුල ද පොදුවේ දේශපාලන ජීවිතය තුල ද ප්‍රමුඛ තැනක් අත් කර ගත් හමුදාව මතට වාරුවී සිටී.

දෙසැම්බර් 7 වන දින රාජ්‍යයට අයත් *සන්ඩේ ඔබ්සර්වර්* පුවත්පතට දුන් දිගු සම්මුඛ සාකච්ඡාවක් තුල දී ජෙනරාල් ෆොන්සේකා දකුනු ඉන්දියානු තමිල්නාඩු ප්‍රාන්ත රාජ්‍යයේ දේශපාලනඥයන්ට පහර දෙමින් නව දිල්ලි පාලනය විසින් ශ්‍රී ලංකාවේ ආන්ඩුව එල්ටීටීඊ සංවිධානය සමග සටන් විරාමයකට එලඹිය යුතුය යි එම දේශපාලනඥයන් විසින් මතු කර ඇති ඔවුන්ගේ ඉල්ලීම හෙලා දැක්කේ ය. "එල්ටීටීඊය අතුගා දමුනු ලැබුව හොත් (තමිල් නාඩුවේ) නැදුමාරන්, වයිකෝ වැනි එල්ටීටීඊය සමග හිතවත්කම් පවත්වන දේශපාලන විකටයන්ට ඔවුන් එල්ටීටීඊයෙන් ලබා ගන්නා ආදායම නැතිවී යාමට ඉඩ තිබේ" යයි ප්‍රකාශ කලේ ය.

තමිල් නාඩුවේ විරෝධතා ප්‍රකාශ ඉන්දියානු ආන්ඩුවට බලපෑමක් ඇති කිරීමට ඉඩ තිබේ දැයි ෆොන්සේකාගෙන් ඇසූ කල ඔහු මෙසේ පිලිතුරු දුනි. "ශ්‍රී ලංකාවේ සටන් විරාමයක් ඇති කිරීමට උවමනාවක් ඉන්දියාවේ ආන්ඩුවට නැති බව මට විශ්වාසය. එල්ටීටීඊය ත්‍රස්තවාදී සංවිධානයක් හැටියට ඔවුන් විසින් ලැයිස්තුගත කරනු ලැබ තිබේ. එල්ටීටීඊ සංවිධානයේ නායක ප්‍රභාකරන් අපරාධකරුවෙක් ලෙස පිලිගෙන තිබෙන ඉන්දියානු ආන්ඩුව ඔහුට මරන දන්ඩනය නියම කොට තිබේ. මුම්බායි ප්‍රහාරයෙන් පසු ඉන්දියානු අගමැති සිං ඇති තරම් ගැටලු වලට මුහුන පා සිටී. ඔවුහු එල්ටීටීඊ සංවිධානයට විරුද්ධ වෙති. ඒ නිසා එල්ටීටීඊයට වාසිදායක කිසිවක් සිදුවනු නැත."

අපේක්ෂා කල හැකි පරිදි ම ෆොන්සේකාගේ කතාව ඉන්දියාව තුල දේශපාලන කුනාටුවක් අවුලුවා ලී ය. පසුගිය ඔක්තෝබරයේ දී තමිල් නාඩුවේ ඇවිලී ගිය විරෝධතා යලිත් අවුලුවා ලීමට එය තුඩු දුනි. ඔක්තෝබර් 26 දා තම සහෝදර බැසිල් රාජපක්ෂ නව දිල්ලියට යවා ඉන්දියානු පාලනය සමහන් කිරීමට ද ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යන වර්ගවාදී යුද්ධයට විරුද්ධ වීමට ඉන්දියාව කිසිවක් නොකරන බවට ප්‍රතිඥාවක් ලබා ගැනීමට ද ජනාධිපති රාජපක්ෂ කලින් වැඩ කර තිබුනු තමිල් නාඩු පක්ෂ ඔහුගේ ආන්ඩු සන්ධානයෙන් ඉවත් නොවන බවට සහතිකයක් ලබා ගැනීමටද ඒ දිනවල ඉන්දියානු අගමැති මන්මෝහන් සිං සමත්ව සිටියේ ය.

රාජපක්ෂ යලිත් යුද්ධය ආරම්භ කල තැන් පටන් ඉන්දියානු ආන්ඩුව ඉතා සූක්ෂම හරඹයක නිරතව සිටී. ඉන්දියාව තුල බෙදුම්වාදයට ධෛර්ය දීමට හෝ ප්‍රදේශීය රයිවලුන් වූ පකිස්ථානයට හා චීනයට ලංකාවේ වැඩි බලපෑමක් අත් කර දීමට හෝ අකැමති නව දිල්ලි පාලනය ශ්‍රී ලංකාවේ ආන්ඩුවට දේශපාලනිකව හා යුද්ධමය වශයෙන් හිමින් සීරුවේ සහාය දී තිබේ. ඒ සමග ම ලංකාවේ දෙමල සුලුතරය සමග බලවත් සම්බන්ධකම් පවත්නා තමිල් නාඩුවේ හැඟීම් නිකම්ම නොතකා හැරීම ද සිංට කල නොහැක්කකි. තමිල් නාඩු දේශපාලකයන්ගේ ඉරියව් පෑම පෙන්නුම් කරන්නේ ශ්‍රී ලංකාවේ හමුදාව දිවයිනේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල සිවිල් ජනයාට එරෙහිව එල්ල කරන්නා වූ ඉවක්බවක් නැති ප්‍රහාරයන් පිලිබඳව ඇති මහජන විරෝධය යි.

ෆොන්සේකාගේ ප්‍රකාශයන් වනාහී අහම්බෙන් කරන ලද ඒවා නොවේ. ඔහු තමාගේ සම්මුඛ සාකච්ඡාව කලේ තමිල් නාඩු දේශපාලකයින්ගේ ඉල්ලීම මත ඉන්දියානු විදේශ කටයුතු භාර ඇමති ප්‍රනාබ් මුඛර්ජි ශ්‍රී ලංකාවට එවා සටන් විරාමයක් ගැන හැකියාව ගැන සාකච්ඡා කිරීමට නව දිල්ලි පාලනය එකඟ වී දින කීපයක් ගතවීමට පෙර ය. නව දිල්ලිය මෙය තදින් කියා සිටීමට තිබෙන ඉඩ ඉතාම අඩු වන අතර, සමපේක්ෂනයට භාජනය වී තිබුනේ, මුඛර්ජි මෙම ප්‍රශ්නය අඩු ගනනේ සාකච්ඡා කිරීම සඳහා වුව ඉස්මතු කරතැයි යන්න ය. සිතා මතාම රාජ්‍ය තාන්ත්‍රික සන්ඩුවක් ඇති කිරීම මගින් ෆොන්සේකා පැහැදිලි

කලේ මිලිටරිය මෙවන් කුමන සාකච්ඡාවක් හෝ නො ඉවසන බවයි. දැන් මුඛර්ජි තම ලංකා ගමන දින නියමයක් නැතිව කල් තබා ඇත.

ඉක්බිතිව කොලඹ දී සිදුව ඇති දේ බරපතල පාඩම් ගැබ් කර ගනී. ෆොන්සේකාගේ කතාවට එරෙහිව නිල විරෝධයක් දක්වන ලෙස ඉන්දියානු ආන්ඩුව කොලඹ සිටින තම තානාපතිවරයා ඇනවී ය. මෙයට කොලඹ ආන්ඩුව දැක් වූ අසාමාන්‍ය ප්‍රතික්‍රියාව වූයේ ජනාධිපතිවරයාගේ තවත් සහෝදරයෙකු වූ ශ්‍රී ලංකා ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ලවා ෆොන්සේකා වෙනුවට, පිලිතුරු සපයමින් මෙම ප්‍රකාශය යලිත් නොකරන බවට සහතික වීම ය. ආන්ඩුව මෙම සාකච්ඡාව පලකල සන්ඩේ *ඔබ්සර්වර්* පුත්පතේ කතුවරයා ඉවත් කලේ ය.

ෆොන්සේකාගේ ක්‍රියා විවේචනය කිරීම මගහැරි ජනාධිපති රාජපක්ෂ ඒ වෙනුවට ජෙනරාල්වරයාට මහත්සේ ප්‍රශස්ති ගායනා කලේ ය. දෙසැම්බර් 12 දා පැවැත්වුනු හමුදා උත්සවයක දී ෆොන්සේකා "ලෝකයේ ඉන්නා ඕනෑම අන දෙන නිලධාරියෙකු හා සමය යි" ඔහු ප්‍රකාශ කලේ ය. " ජෙනරාල් ෆොන්සේකාගේ නායකත්වය යටතේ සටන් කරන හමුදාව මහජනතාවගේ හදවත් දිනාගෙන තිබේ ය"යි ද ඔහු කියා සිටියේ ය. අඹේපුස්සේ සිංහ රෙජමෙන්තු මධ්‍යස්ථානයේ උත්සව වේදිකාවේ හිඳ රාජපක්ෂගේ කතාව අසාගෙන සිටි ෆොන්සේකා රාජපක්ෂට සැමරුම් ඵලකයක් තිලින කලේ ය.

යුද්ධය යලි අවුලුවාලීමෙන් ආන්ඩුව " මහජනතාවගේ හදවත් දිනාගැනීම" කෙසේ වෙතත් රටේ ආර්ථික හා සමාජ අර්බුදය උග්‍ර කර තිබෙන අතර මහජනතාවට එය ගැඹුරින්ම එපා වී තිබේ. හෙලවෙන පාර්ලිමේන්තු සන්ධානයක පය රඳවාගෙන සිටින රාජපක්ෂ එන්න එන්නම වැඩිවැඩියෙන් තමාගේ අතේ බලය සංකේන්ද්‍රනය කර ගෙන සිටී. ඔහු එසේ කර ඇති අතර ජනාධිපති වරයා ඕනෑම විරුද්ධ පක්ෂයක "ජාතික ආරක්ෂාවේ" නාමයෙන් නිහඬ කර දැමීමට මාර්ගයක් ලෙස යුද්ධය මත රැඳී ගෙන සිටී.

එහෙයින් ෆොන්සේකා රාජපක්ෂගේ කල්ලිය තුල ප්‍රමුඛ පුද්ගලයෙකු වීම පුදුමයක් නොවේ. රාජපක්ෂගේ සහෝදරයා වන ගෝඨාභය ද ෆොන්සේකා ද සුප්‍රසිද්ධ ආනන්ද විද්‍යලයේ පාසල් සගයන් වූ අතර සිංහ රෙජමෙන්තුවේ නිලධාරීන් හැටියට එකට වැඩ කර තිබේ. මුලින්ම හමුදාවේ අන දෙන නිලධාරියා ලෙස ෆොන්සේකා පත් කල ජනාධිපති රාජපක්ෂ මෑත දී අනිවාර්ය විශ්‍රාම වයසෙන් ඔබ්බට තවත් අවුරුද්දක් ඔහුට සේවය දීර්ඝ කලේ ය.

ගෝලීය ආර්ථික පසුබැස්ම සහ සමාජ අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ ආන්ඩුව උග්‍රවන්නා වූ ආර්ථික හා සමාජ අර්බුදයකට මුහුන දී සිටී. රාජපක්ෂ නිරතුරුවම ජාතිමාමක උජ්නය අවුස්සාලීමට උත්සාහ දැරුවත් යුද්ධයට හා ආර්ථික බරබද්දල්වලට එරෙහි මහජන විරෝධය අනිවාර්යයෙන්ම පැන නගෙනු ඇත. විරුද්ධ පක්ෂයන් දැනට ම පුලුල්ව අපකීර්තියට පත්ව සිටින අතර එහෙයින් ආරක්ෂක වැල්වයක් ලෙස ක්‍රියා කිරීමට අසමත්ව සිටින තතු තුල පාලක ප්‍රභූව "ජාතියේ ගැලවුම්කරුවා ලෙසට ද" ධනේශ්වර පාලනයේ ඉරනමේ භාරකරුවා ලෙසට ද හමුදාවේ පැත්තට ද ෆොන්සේකා වැනි පුද්ගලයෙකු දෙසට ද හැරී ගැනීමට හොඳටම ඉඩ තිබේ.

එවන් වාතාවරනයක් තුල, පසුගිය දෙසැම්බර් 11 දා "ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකා - "අවස්ථාවේ පුද්ගලයා" යන මාතෘකාව යටතේ - නිල රාජ්‍ය වෙබ් අඩවියට දුන් සම්මුඛ සාකච්ඡාව වඩාත් බරපතල අර්ථභාරයක් දරා සිටී.

යුද්ධයට වෙනත් ප්‍රවේශයක් සහිත වෙනත් තත්වයක් යුද්ධමය වශයෙන් අවාසි අත් කර දේ දැයි අසනු ලැබ ෆොන්සේකා මෙසේ ප්‍රකාශ කලේ යඃ " මහජනයා දුබල පාලකයෙක් පත් කර ගත හොත්, එනම් අපගේ හැකියාව අඩු තක්සේරු කරන්නා වූ ත්, සතුරාගේ ශක්තිය හා ධාරිතාව වැඩියෙන් තක්සේරු කරන්නා වූත් දුබල නායකයෙකු - ඡන්දයෙන් තෝරා පත් කර ගතහොත් අපට භූමි ප්‍රදේශ නැති වී ගොස් ගැටලුව තවත් උග්‍ර වනවා ඇත. එවන් පුද්ගලයෙක් නායකයෙකු විය හැකිය. එහෙත් නිශ්චිතව ම ජාති මාමකයෙකු නොවනු ඇත."

ෆොන්සේකා තව දුරටත් මෙසේ කීයඃ "මා සිතන්නේ, අනෙකුත් රටවල මෙන්, ආන්ඩු මාරුවී ගියද ජාතික ආරක්ෂාව වෙනස්විය යුතු නැත. ජනාධිපතිවරයා ජාති හිතෛෂියෙකු විය යුතු ය. අප සාඩම්බරව හා ගෞරවයෙන් ජීවත් විය යුතු ය. මෙම අවශ්‍යතාවය බලයේ සිටින සෑම කෙනෙකු විසින් ම පිලිගත යුතුව ඇත." ඔහු අවසන් කලේ යන්තමින් පමනක් පැවසුනු තර්ජනයකිනිඃ "ජනාධිපතිවරු හා දේශපාලකයෝ එති, යති. එහෙත් පුරවැසියෝ දිගටම සිටිති. ඔවුන්ට ආරක්ෂාවක් අවශ්‍යවේ."

මහජනයා ජාතිමාමකයෙකු නොවූ නායකයෙකු තෝරා පත් කර ගත හොත් ඔහු කුමක් කරන්නේ දැයි සාකච්ඡාකරුවා ෆොන්සේකාගෙන් විමසුවේ නැත. එහෙත් ෆොන්සේකාගේ තර්කවලින් නිගමනය දැනටම පැහැදිලි ය. මහජනතාව ඡන්දයෙන් තෝරා පත් කරගත් අයෙකු පුරවැසියන් සඳහා "ආරක්ෂාවේ" නාමයෙන් ඉවත් කර දමා කිසියම් ආකාර හමුදා පාලනයක් ඇටවීමට හමුදාවට සිදු වීමට ඉඩ තිබේ. යුද්ධයට එරෙහි මහජනයාගේ දේශපාලන ව්‍යාපාරයක් පැන නැග්ගොත්, අතිශය ආන්තික පියවරයන් ගැනීමට ෆොන්සේකා පසුබට නොවනු ඇත.

"විමුක්ත" කර ගෙන ඇතැයි ආන්ඩුව කියන ප්‍රදේශවල, ආන්ඩුව දැනට ම පැහැරගෙන යාම් හා ඝාතන පිලිබඳව නම් දරාපු සන්නද්ධ කල්ලියක නායකයකුගේ ප්‍රමුඛත්වයෙන් සැබැවින්ම යුද්ධමය පාලනයක් අටවා තිබේ. දැනට උග්‍ර සටන් පවත්නා උතුර සඳහා ද එම සැලැස්ම ම සකසා තිබේ. යුද්ධයේ අවශ්‍යතා සපුරා ලීම සඳහා හමුදා සංඛ්‍යා බලය උග්‍ර කරනු ලැබ තිබේ. ෆොන්සේකාට අනුව හමුදාව තම සංඛ්‍යාව දැනට පවත්නා 130,000 සිට 200,000 දක්වා ඉහල දමා ගැනීමට අනුමැතිය ලබා ඇත. ජනගහනයට සමානුපාතිකව ගතහොත් ලංකාව ලෝකයේ හමුදාවේ සංඛ්‍යාව වැඩිම රටවල් අතරට වැටෙයි. වයස 18 සිට 49 දක්වා වූ සියලු පිරිමින්ගෙන් 25කට එකක් තරම් මේ රටේ හමුදාවට බැඳී සිටිති.

රාජපක්ෂ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" ආන්ඩුවේ ඉහවහා යන පිලිවෙත බවට පත් කර මුලු රටම යෝධ හමුදා කඳවුරක් බවට පත් කර ඇත. මෙම තතු තුල තමාට කිසිම දඬුවමක් ලැබීමේ අනතුරෙන් තොරව ක්‍රියා කොට විදේශ ප්‍රතිපත්තිය ද තීන්දු කිරීමට හැකැයි හමුදාපතිවරයා දැන සිටී. "ජාතික ආරක්ෂාව" උදෙසා සූදානම් යයි ආන්ඩුව අසමත් යයි පෙනී ගියහොත් ෆොන්සේකාගේ වචනවලට අනුව ජනාධිපතිවරු හා දේශපාලකයන් එනු ඇත, යනු ද ඇත.

© www.wsws.org